**ඉමදූව ප්‍රාදේශීය සභාව - 2021**

**------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 අහිතකර මතය**

**----------------**

ඉමදූව ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට ඉමදූව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 අහිතකර මතය සඳහා පදනම**

**--------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා, මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ 2021 දෙසැම්බර් 31 දිනට මුළු වත්කම් රු.158,500,785 ක් වූ අතර, එකිනෙක සමාන වියයුතු මුළු හිමිකම් සහ වගකීම් රු.205,161,320 ක් වීමෙන් රු.46,660,535 ක වෙනසක් පැවතුණි.<br><br>(ii) 2021.12.31 දිනට ශේෂ පිරික්සුමට ඇතුළත් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් නොවූ රු.153,475 ක ගිණුම් ශේෂ 08 ක් පැවතුණි.<br><br>(iii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අතැති තොගය රු.793,357 ක් වූ අතර, එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට රු.4,678,150 ක් ලෙස රු.3,884,793 ක් වැඩියෙන් දක්වා තිබුණි.<br><br>(iv) 2021.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑ රු.11,621,711 ක් විය යුතු අතර, එය රු.15,120,159 ක් ලෙස රු.3,498,448 ක් වැඩියෙන් දක්වා තිබුණි.<br><br>(v) 2021.12.31 දිනට රු.27,008,792 ක ණයගැති ශේෂයක් ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.<br><br>(vi) සමාලෝචිත වර්ෂයේ ඌණතාවය රු.6,114,242 සමුච්චිත අරමුදල් ගිණුමට ගලපා නොතිබුණු අතර, 2021.12.31 දිනට ශුද්ධ වත්කම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනයේ 2021.01.01 දිනට ශේෂය රු.37,146,498 ක් වියයුතු අතර, එය රු.30,942,786 ක් ලෙස රු.6,203,712 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් ගත කළයුතු වේ. |

(vii) 2021.12.31 දිනට ශුද්ධ වත්කම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනයේ කාලච්ඡේදය සඳහා වන අතිරික්තය රු.6,114,242 ක් වෙනුවට රු.6,016,721 ක් ප්‍රාග්ධන යෙදවුමෙන් ආදායමට දායක වීමේ ගිණුමට ගලපා තිබුණු අතර, වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු.2,283,962 ක් හා පෙර වර්ෂ ගැලපීම් ලෙස රු.5,565,337 ක් ගලපා රු.123,782,602 ක් ලෙස 2021.12.31 දිනට ශේෂය ලබාගෙන තිබුණු අතර, මෙම සංඛ්‍යා ව්‍යාජ සංඛ්‍යා බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(viii) පොදු ලෙජරයෙහි හරට සටහන් වී ඇති එම හර සටහනට අදාළ බැර සටහනක් පොදු ලෙජරයට ඇතුළත් වී නොමැති එකතුව රු.2,013,808 ක ගිණුම් විෂයයන් 04 ක් පැවතුණි.

(ix) පොදු ලෙජරයේ ගිණුම් 07 ක එකතුව රු.4,993,016 ක් වූ හර සටහන් තබා තිබුණු අතර, ඊට අදාළ බැර සටහන් පොදු ලෙජරය තුළ ඇතුළත් වී නොතිබුණු අතර, පොදු ලෙජරයේ ගිණුම් 21 ක එකතුව රු.19,750,478 ක් වූ බැර සටහන් තබා තිබුණු අතර, ඊට අදාළ හර සටහන් පොදු ලෙජරයට ඇතුළත් වී නොතිබුණි. එමෙන්ම හරට හෝ බැරට ගිණුම්වලට ඇතුළත් කළ රු.24,743,494 ක් වටිනාකමට අදාළ තොරතුරු සභාව සතුව නොතිබුණි.

(x) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු ලෙජරයේ ආදායම් වියදම් ගිණුම් විෂයයන් 28 ක ආදායම් වියදම් ගිණුමට ගැලපිය යුතු වටිනාකම රු.59,918,334 ක් වුවද, එය රු.56,058,767 ක් ලෙස රු.3,859,567 ක වෙනසක් නිරීක්ෂණය විය.

(xi) සමාලෝචිත වර්ෂය තුළ රු.1,379,517 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි අයිතම 07 ක වටිනාකම ද, රු.808,297 ක් වටිනා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අයිතම 14 ක වටිනාකම ද රු.596,115 ක් වූ ලී බඩු හා සවිකිරීම් අයිතම වර්ග 04 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(xii) සමාලෝචිත වර්ෂය තුළ අපහරණය කරන ලද රු.1,030,000 ක් වටිනා සිංගල් කැබ් රථය හා රු.833,000 ක් වටිනා ට්‍රැක්ටර් රථය මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(xiii) සමාලෝචිත වර්ෂය තුළ විදුලි තොග මිලට ගැණුම් රු.639,409 ක් සහ නිකුත් කිරීම් රු.810,965 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(xiv) සමාලෝචිත වර්ෂය තුළ පොදු ගබඩා තොග මිලට ගැණුම් රු.403,378 ක් සහ නිකුත් කිරීම් රු.305,187 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(xv) සමාලෝචිත වර්ෂය තුළ පරිත්‍යාග ලෙස හා මිලදී ගත් රු.495,000 ක් වටිනා ආයුර්වේද තොග හා වර්ෂය තුළ නිකුත් කල රු.241,863 ක් වටිනා ආයුර්වේද තොග ගිණුම් ගතකර නොතිබුණි.

(xvi) සමාලෝචිත වර්ෂය තුළ උප කාර්යාලයේ ව්‍යාපාර බදු බිල් කිරීම් රු.365,030 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණු අතර, බහු කාර්ය ගොඩනැගිල්ල බදු දීම රු.504,000 ක කුලී ගිණුම් ගතකර නොතිබුණි.

(xvii) සමාලෝචිත වර්ෂය තුළ රු.592,390 ක් වූ වරිපනම් බදු

නිවැරදි කිරීමට කටයුතු කරමි.

නිවැරදිව ගිණුම් ගත කළයුතු වේ.

රු.1,472,085 ක් ලෙස රු.879,695 ක් වැඩියෙන් බිල් කර තිබුණි.

(xviii) සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර රු.17,739,881 ක් ද, කර්මාන්ත ණයහිමියන් රු.18,549,125 ක් ද ගිණුම් ගතකර නොතිබුණි.

(xix) සමාලෝචිත වර්ෂයේ වියදම් ණයහිමියන් සඳහා රු.1,468,297 ක් සහ විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන ඇතිකර නොතිබුණි.

(xx) සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද වැටුප් හා වේතන ණයහිමියන් රු.417,326 ක් හා සේවක අර්ථසාධක ණයහිමියන් රු.42,140 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(xxi) සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර තැන්පතු පොලී ලැබීම් රු.264,540 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(xxii) සමාලෝචිත වර්ෂය තුළ දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය රු.157,670 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(xxiii) 2021 වර්ෂයේ වැය විෂයයන් 18 ක ඒකාබද්ධ වැය සාරාංශය අනුව වටිනාකම රු.237,350,152 ක් වූ අතර, වැය ලේඛනයේ රු.22,222,217 ක් ලෙස ගිණුම් ගත කිරීමෙන් රු.215,127,935 ක වෙනසක් නිරීක්ෂණය විය.

(xxiv) සමාලෝචිත වර්ෂයට අදාළව ලෙජරයෙහි ගිණුම් දක්වා නොමැති ආදායම් විෂයයන් 06 ක රු.5,414,018 ක ශේෂයක් ආදායම් වියදම් ගිණුමට ගලපා තිබුණි.

(xxv) සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු ගත උසාවි දඩ රු.1,100,000 ක් හා මුද්දර ගාස්තු රු.10,900,000 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(xxvi) ඉකුත් වර්ෂය තුළ පුස්තකාල පොත් මිලදී ගැනීමේදී ලද වට්ටම් රු.86,198 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(xxvii) ඉකුත් වර්ෂයේ පොදු පරිපාලන වැඩසටහන යටතේ ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තු වියදම රු.82,719 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

නිවැරදි කිරීමට කටයුතු කරමි.

නිවැරදිව ගිණුම් ගත කළයුතු වේ.

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 22 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.15,298,337 ක වෙනසක් නිරීක්ෂණය විය. | විගණනයෙන් පෙන්වා ඇති කරුණු පිළි ගනිමි. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.14,489,132 ක් වූ ගිණුම් විෂයයන් 08 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂය තහවුරු කෙරෙන සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| මුදල් රෙගුලාසි 571(1)(2)(3) | 2013 ජනවාරි 01 දිනට පෙර සිට පැවත එන රු.3,702,956 ක් වූ ගෙවල් කුලී තැන්පතු, විවිධ තැන්පතු, කොන්ත්‍රාත් තැන්පතු වලට අදාළ තැන්පත් කළ දිනය, තැන්පත්කරුගේ නම, තැන්පත් කරන ලද කාරණය පිළිබඳ තොරතුරු සභාව සතුව නොතිබුණි. එම තැන්පතු පිළිබඳව තොරතුරු පරීක්ෂා කර, මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,130,963 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,871,849 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ) වරිපනම් හා බදු**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් ඒකක 541 කින් රු.936,097 ක් වූ අතර, එහි වසර 05 කට පෙර සිට පැවත එන වරිපනම් ඒකක 48 කින් රු.292,051 ක ශේෂයක් ඇතුළත් වී තිබුණි.<br><br>**(ආ) ව්‍යාපාර බදු**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ව්‍යාපාර බදු මුදල රු.908,920 ක් වූ අතර එහි වසර 03 ත් 05 ත් අතර කාලයක සිට හිඟව පවතින රු.177,450 ක ශේෂයක් ඇතුළත් වී තිබුණි. | අයකර ගැනීමට කටයුතු කරමි. | ලැබිය යුතු ශේෂ අයකර ගතයුතු වේ. |